# වාර්ෂික කාර්යය සාධන වාර්තාව - 2017

*නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය*

*දෙවන මහල*

*"සෙත්සිරිපාය", බත්තරමුල්ල*



# ගරු අමාත්‍යතුමාගේ පණිවුඩය

වසර 2025 දී “සැමට සෙවණ” ඉලක්ක කර ගත් අපගේ ප්‍රශස්ථ නිවාස සංවර්ධන වැඩපිළිවෙල විවිධ බාධක අභියෝග ජය ගනිමින් ඉදිරියට ගමන් කරයි.

නිවාස අවශ්‍යතා පිළිබඳ 2016 දී දීප ව්‍යාප්ත මට්ටමින් දියත් කළ පුළුල් සමීක්ෂණයෙන් මෙරට පවතින සැබෑ තත්ත්වය අනාවරණය කරගත හැකි විය. ඉන් අනාවරණය වුයේ 6,094,115 ක් වන මෙරට මුළු පවුල් සංඛ්‍යාවෙන් පවුල් 2,568,451 ක් එනම්, 42% ක්ම කවර හෝ ආකාර නිවාස ගැටලුවකින් පෙළෙන බවය.

මෙරට නිවාස ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම පිණිස 2017 වසරේදී නිවාසකරණය, ජනාවාස යටිතල පහසුකම් ආදී සංවර්ධන ක්ෂේත්‍රවල විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් අර්ථවත් කාර්යභාරයක් ඉටුකර තිබේ. ඊට එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස සංවර්ධන වැඩසටහනින්ද අගනා සහායක් හිමිවිය.

2025 දී සැමට සෙවණ හිමිකරදීමේ අපගේ ප්‍රයත්නය වෙනුවෙන් සම්පාදිත මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම යටතේ දැනට වෙනත් අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන නිවාස සංවර්ධන වැඩසටහන් හා සැළසුම්ද අධීක්ෂණය වනු ඇත. ඒ අනුව කිසිදු ජන කොටසක් මගහැරී නොයන පරිදි නිවාස සංවර්ධන වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීමේ අභියෝගාත්මක වගකීම අපගේ අමාත්‍යාංශය යටතේ පවතිනු ඇත.

නිවාස වැඩසටහන් වලදී මේ දක්වා සැලකිල්ලට ගත් අඩු ආදායම්ලාභී කාණ්ඩයට අමතරව ආපසු ණය වාරික ගෙවීමේ හැකියාවක් නොමැති අන්ත දුගී පවුල් වෙනුවෙන් “ග්‍රාම ශක්ති” නිවාස ආධාර වැඩසටහනද දියත් කිරීමට පියවර ගන්නා ලදි. එමෙන්ම යුද්ධයෙන් පීඩාවට පත් උතුරු හා නැගෙනහිර පළාත් වල ප්‍රජාව වෙත ආධාර ලබාදීමේ නිවාස වැඩසටහන් දියත් කිරීමත්, එම යුද්ධයෙන් පීඩාවට පත් රණවිරුවන් උදෙසා “විරු සුමිතුරු” නිවාස වැඩසටහන ආරම්භ කිරිමට පියවර ගැනීමත් සටහන් තැබීමට වැදගත් ප්‍රවේශයන් ද්විත්වයකි. එමෙන්ම හදුනානොගත් කාලික වකුගඩු රෝගයෙන් පීඩාවට පත් පවුල් සඳහා මෙන්ම සියඹලාණ්ඩුව, වව්නියාව, බෝගස්වැව ආදී ආර්ථික වශයෙන් පසුබට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල විශේෂ නිවාස ව්‍යාපෘති දියත් කිරීම ආදි සුවිශේෂි වැඩසටහන් රැසක් 2017 වර්ෂයේදි ආරම්භ කල හැකි විය.

තවද මහල් නිවාස ප්‍රතිසංස්කරණය, මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතිය දියත් කිරීම, රජයේ කුලී නිවාස වල හිමිකරුවන්ට හිමිකම් ඔප්පු ප්‍රදානය, සභාධිපත්‍ය දේපල ආශ්‍රිත සංවර්ධන කටයුතු මෙන්ම, නාගරික අඩු පහසුකම් සහිත ජනාවාස වල භෞතික හා සමාජයීය සංවර්ධනය උදෙසා මහත් මෙහෙවරක් 2017 වර්ෂය තුල දී ඉටුකල හැකි විය.

එමෙන්ම ඉදිකිරීම් කර්මාන්තයේ මිල නියාමනය කිරීම සඳහා අදාල මැදිහත්වීම් සිදුකරමින් හා ගුණාත්මක සේවාවක් සපයනු වස් ඉදිකිරීම් අංශයේ අනුබද්ධිත ආයතන දිරිමත්ව නගාසිටුවමින් හා නව ව්‍යාපෘති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම සිදු කරමින් ඉටුකල කාර්යය භාරයද ඉදිකිරීම් විෂයානුබද්ධව ජාතික, ආර්ථික දේහයට මහත් සවියක් වූ බව නිසැකය.

ජාතික සංවර්ධන ක්‍රියාවලිය තුළ අපගේ කාර්යභාරය කොතරම් ඇගයීමට පාත්‍ර වී ඇත්ද යන්න 2018 සමස්ථ අය-වැයේ ප්‍රාග්ධන යෙදවුම් වලින් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත වෙන්කල මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 6.9 ක් දක්වා ඉහළ නංවා තිබීමෙන් සනාථ වෙයි. එහි වැය දැරීමේ සාපල්‍යතාවය 100% ක් ලෙස සනාථ කරමින් සෙසු අමාත්‍යාංශ අතර ප්‍රමුඛස්ථානයට පැමිණීමට අපට හැකි විය.

මේ සාර්ථකත්වයට මංපෙත් විවර කරදුන් අතිගරු ජනාධිපතිතුමන් හා ගරු අග්‍රාමාත්‍යතුමන් ඉමහත් කෘතවේදීත්වයෙන් යුතුව සිහිපත් කරමි. මා හැමවිටම දිරිගැන්වූ අමාත්‍යාංශ ලේකම්තුමන්ලා දෙපළ ප්‍රමුඛ කාර්යමණ්ඩලය, අමාත්‍යාංශය යටතේ පවතින සියලු ආයතන වල සභාපතිවරුන් ප්‍රමුඛ සෙසු නිලධාරීන් වෙත කෘතඥතාපූර්වකභාවය පළ කිරීමටද මෙය අවස්ථාවක් කරගනිමි.

**සජිත් ප්‍රේමදාස**
නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය

## ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



නිවාස වැඩසටහන් දියත් කිරීම සම්බන්ධයෙන් ඉහළම ජනතා විශ්වාසයක් දිනාගත් වර්ෂයක අවසානයෙහි එම විෂයභාර රේඛීය අමාත්‍යාංශයේ කාර්යය සාධන වාර්තාව සඳහා සුභපැතුම් පණිවුඩයක් නිකුත් කරන්නේ ඉමහත් සතුටකිනි.

නිවාස වැඩසටහන් දියත් කිරීමේදී මේ දක්වා ප්‍රමුඛතාවය හිමි වූ අඩු ආදායම්ලාභී කාණ්ඩයට අමතරව 2017 දුගී බවින් නිදහස් වීමේ වසර ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් දියත් කල ජාතික වැඩසටහන් හා සමගාමීව, අන්ත දිළිඳු ජන කොටස් වෙත නිවාස වැඩසටහන් දිශානත කිරීමට හැකියාව ලැබීම පසුගිය වසර තුල අප ලැබූ ඉතා වැදගත් ජයග්‍රහණයකි.

ඒ අනුව, ආර්ථික හා සමාජයීය වශයෙන් පසුබට කලාප මෙන්ම අන්ත දුගී පුද්ගලයන් උදෙසා "ග්‍රාම ශක්ති" ආදර්ශ ගම්මාන වැඩසටහන දියත් කරනු ලැබීය. එමෙන්ම හඳුනානොගත් කාලික වකුගඩු රෝගයෙන් පීඩාවට පත්වූ පවුල් හා රණවිරු පවුල් ප්‍රමුඛ කොටගත් විවිධ ජන සමූහයන් උදෙසා නිවාස ගැටළුව විසඳා දෙන වැඩසටහන් රැසක් ආරම්භ කිරීමට පියවර ගන්නා ලදි.

ඉදිකිරීම් කර්මාන්තය නගාසිටුවීම විෂයෙහිදී ද නෛතික හා ආයතනික රාමුව සවිබල ගැන්වීම මෙන්ම ඉදිකිරීම් කර්මාන්තය මුහුණදෙන කාලීන අභියෝග ජයගැනීම උදෙසා වැඩසටහන් සම්පාදනයෙන්ද වෙහෙසී කටයුතු කොට ප්‍රතිඵල ලැබූ වසරක් ලෙස 2017 වර්ෂය පිළිබඳව සතුටට පත්විය හැකිය.

ජනතාවගේ යහපත හා ජාතික අභිවෘද්ධිය උදෙසා දැනෙන කාර්යභාරයක් ඉටුකිරීම වෙනුවෙන් අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන් ඇතුළු අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදුන් ධෛර්යය හා ශක්තිය වෙනුවෙන් කෘතවේදී වන අතරම නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමන් විසින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රවල සංවර්ධන උපායමාර්ග ක්‍රියාත්මක කිරීම හා ඉලක්ක ජයගැනීම සඳහා ලබාදෙන නායකත්වය ඇගයීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

එමෙන්ම 2017 වර්ෂය තුල අභියෝග ජයගැනීම සඳහා කැපවී කටයුතු කල අමාත්‍යාංශ ලේකම් තුමන්ලා දෙපළ ඇතුළු සමස්ත කාර්යය මණ්ඩලයටත්, අනුබද්ධ ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු සියළුම කාර්යය මණ්ඩලයන්ටත්, ගරු අමාත්‍යතුමාගේ හා මාගේ පෞද්ගලික කාර්යය මණ්ඩල වලටත් හෘදයාංගම ස්තූතිය පුදකර සිටිමි.

**ඉන්දික බණ්ඩාරනායක**
නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍ය

## ලේකම්තුමාගේ පණිවුඩය



නිවාස සහ ඉදිකිරීම් යන දෙඅංශයෙන්ම ඉලක්කගත සංවර්ධන කාර්යයභාරයක් කාර්යක්ෂමව ඉටුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම අමාත්‍යාංශයට වෙන් වූ වාර්ෂික ප්‍රතිපාදන වලින් 100% ක් අරමුණු දිශානතව වැයදරා මුල්‍යා යෙදවුම් කාර්යක්ෂමතා සටහනෙහි මුල් තැනට පත්වීමට හැකියාව ලැබූ බව සටහන් තබන්නේ නිහතමානී සතුටකිනි.

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේදී දියත් කල නිවාස අවශ්‍යතා සමීක්ෂණයේ තොරතුරු පදනම් කොටගෙන දිවයිනේ සෑම තැන්හිම විසිරී සිටින විවිධ වූ ජන කොටස් පීඩා විඳින නිවාස ගැටළුවල යථා තත්ත්වය නිවැරදිව හඳුනාගෙන, ඒ සඳහා විධිමත් පදනමකින් වැඩසටහන් සැලසුම් කිරීමට කටයුතු කල වර්ෂයක් ලෙස 2017 වර්ෂය හඳුන්වා දිය හැකිය.

ඉදිකිරීම් කර්මාන්තය නගාසිටුවීම සඳහා නවක ශිල්පීන් ක්ෂේත්‍රයට අවශෝෂණය කර ගැනීමෙ "ශිල්ප සවිය" වැඩසටහන සාර්ථක ප්‍රතිඵල අත්කර දෙමින් දියත් කල අතර ඉදිකිරීම් කර්මාන්තය නගාසිටුවීමට අදාල නෛතික හා ප්‍රතිපත්තිමය රාමුව සවිබල ගැන්වීම සඳහා ප්‍රශස්ත කාර්යය ප්‍රමාණයක් ඉටුකල වර්ෂයක් ලෙස ද 2017 වර්ෂය හඳුන්වා දිය හැක.

නිවාස සංවර්ධනය මෙන්ම ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගතිය උදෙසා ප්‍රතිපත්තිමය තීරණ ගනිමින් ඒ සඳහා අවශ්‍ය සම්පත් යෙදවීම හා මග පෙන්වීම නිවැරදි ලෙස ඉටු කරමින් අප වෙහෙසී කටයුතු කළෙමු. මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ප්‍රතිපත්තිමය තීන්දු බලාත්මක කිරීම හා මගගැන්වීම සඳහා අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු ගරු අමාත්‍යමණ්ඩලය ලබාදුන් විශිෂ්ට දායකත්වය කෙරෙහි කෘතවේදී වන අතරම මෙම සියළු සාර්ථකත්වයන් අත්කර ගැනීම සඳහා නිවැරදි නායකත්වය හා උපදෙස් ලබාදෙන ගරු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමාටත්, නිරන්තර සහයෝගය ලබාදෙමින් සංවර්ධන වැඩසටහන් සඳහා දිරිගන්වන ගරු නියෝජ්‍ය අමාත්‍ය ඉන්දික බණ්ඩාරනායක මැතිතුමාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

නිවාස හා ඉදිකිරීම් විෂයන්ට අදාලව කටයුතු කිරීමේදී වෙනත් අමාත්‍යාංශ හා ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව ජාතික මට්ටමේ සහ දිස්ත්‍රික්, ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීන් සමග මනා සම්බන්ධීකරණයෙන් යුක්තව කටයුතු කිරීමට ඔවුන්ගෙන් ලැබුණු සහයෝගය ඉතා අගය කොට සළකමි.

එමෙන්ම මෙම අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශයට අනුබද්ධ සියලුම ආයතන වල නිලධාරීන් සමග නොකඩවා ප්‍රගති සමාලෝචනය කරමින් කටයුතු කිරීමටද ඔවුන්ගෙන් ලැබුණු සහයෝගය විශේෂයෙන් ඇගයීමට ලක් කරමි.

තවද සියළු කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා කැප වී කටයුතු කරන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරුන් ප්‍රමුඛ සියළුම නිලධාරීන්ට ද, ගරු අමාත්‍යතුමාගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යය මණ්ඩල වලටද, අමාත්‍යාංශයට අනුබද්ධිත සියළුම ආයතන වල ආයතන ප්‍රධානීන් ඇතුළු සමස්ත කාර්යය මණ්ඩල වලටද, නන් අයුරින් සහාය දුන් සියළු රාජ්‍ය හා පෞද්ගලික ආයතන ප්‍රධානීන්ට ද මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි.

**ආර්.එම්.අබේරත්න**
ලේකම්
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

| පෙළගැස්ම | පිටු අංකය |
|---|---|
| 1. හැඳින්වීම | 1-2 |
| 2. අමාත්‍යාංශ දැක්ම හා මෙහෙවර | 3-3 |
| 3. අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් | 4-4 |
| 4. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ | 5-5 |
| 5. අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය | 6-7 |
| 6. අමාත්‍යාංශයේ ව්‍යුහය | 08-12 |
| 6.1. පාලන අංශය | |
| 6.2. සැලසුම් අංශය | |
| 6.3. නිවාස අංශය | |
| 6.4. තාක්ෂණ අංශය | |
| 6.5. ජාතික නිවාස කොමසාරිස් අංශය | |
| 6.6. මූල්‍ය අංශය | |
| 6.7. අභ්‍යන්තර විගණන අංශය | |
| 7. අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන | 13-15 |
| 7.1 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | |
| 7.2 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය | |
| 7.3 සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | |
| 7.4 ඕෂන් වීව් සංවර්ධන පුද්ගලික සමාගම | |
| 7.5 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | |
| 7.6 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව | |
| 7.7 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | |
| 7.8 රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | |
| 7.9 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය | |
| 7.10 රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | |
| 7.11 ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | |
| 8. මූල්‍ය ප්‍රතිපාදන | 16-17 |
| 9. 2017 වර්ෂයේ අමාත්‍යාංශයේ ප්‍රගතිය | 19-24 |
| 9.1 පාලන අංශය | |
| 9.2 සැලසුම් අංශය | |
| 9.3 නිවාස අංශය | |
| 9.4 ඉදිකිරීම් තාක්ෂණ අංශය | |
| 9.5 ජාතික නිවාස කොමසාරිස් අංශය | |
| 9.6 අභ්‍යන්තර විගණක අංශය | |
| 10. 2017 වර්ෂයේදී අමාත්‍යාංශය මුහුණදුන් අභියෝග. | 26-26 |

# 1. හැදින්වීම

අද අප පැමිණ සිටිනුයේ ශ්‍රී ලංකාවේ නිවාස මෙන්ම ඉදිකිරීම් අංශයන්හි වේගවත්ම සංවර්ධන යුගයකටය. නිවාස අංශය ගත් කල 2025 වසර වන විට "සැමට සෙවණ" සාක්ෂාත් කිරීම උදෙසා දිශාගත වු දැවැන්ත වැඩපිළිවෙලක් අප විසින් හදුන්වා දී ඇත.

එම වැඩපිළිවෙල ආරම්භ කරන ලද්දේ 2016 වර්ෂයේ ආරම්භයේදීම දියත් කල දීප ව්‍යාප්ත නිවාස අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය මගිනි. එම නිවාස අවශ්‍යතා සමීක්ෂණය වු කළී මෙරට සෑම පවුල් ඒකකයක්ම මුහුණ දෙන වර්තමාන නිවාස ගැටළුවෙහි සැබෑ ස්වරූපය සංඛ්‍යාත්මකව හඳුනාගැනීම සඳහා ගම් මට්ටමේ රාජ්‍ය නිලධාරීන්ගේ ද සහාය ඇතිව දියත් කල දැවැන්ත ව්‍යායාමයකි. එමගින් මෙරට 6,094,115 ක් වු සමස්ත පවුල් සංඛ්‍යාවෙන් 42% ක්, එනම් පවුල් 2,568,451 ක් කවර හෝ නිවාස ගැටළුවකින් පෙළෙන බව හදුනා ගත හැකි විය.

මෙම නිවාස ගැටළු සමුදාය විවිධ ප්‍රවේශයන් තුළින් විසදීමේ වගකීම නිවාස ක්ෂේත්‍රයේ කටයුතු කරන අමාත්‍යාංශ ගණනාවක් හරහා ක්‍රියාත්මක වුවද ඒවායෙහි කේන්ද්‍රීය ප්‍රතිපත්ති සකස් කිරීම මෙන්ම නියාමනය කිරීමේ වගකීම පැවැරී තිබෙනුයේ මෙම අමාත්‍යාංශයට වේ. ඒ අනුව 2017 වර්ෂයේ දී ලංකාවේ නිවාසකරණ හා ජනාවාස මෙන්ම යටිතල පහසුකම් සංවර්ධන ක්ෂේත්‍රයන්හි කටයුතු කරන විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් හරහා ශ්‍රී ලංකාවේ නිවාස ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සඳහා අත්‍යාවශ්‍ය කාර්යයක් ඉටු කරන ලදි.

එම ජාතික නිවාස ප්‍රතිපත්තිය මගින් 2025 වසර වන විට "සැමට සෙවණ" සාක්ෂාත් කිරීම මෙන්ම එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුව ශ්‍රී ලංකාවේ ජනාවාස සංවර්ධනය සඳහා ආදාළ වන ප්‍රතිපත්ති හඳුනා ගැනීමට කටයුතු කරන ලදි. එම ජාතික නිවාස ප්‍රතිපත්තිය සකස් කිරීමෙහිලා එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස සංවර්ධන වැඩසටහන (UN Habitat) මගින් ද පුළුල් සහයෝගයක් ලබා දෙන ලදී.

ජාතික නිවාස ප්‍රතිපත්තියට අතිරේකව 2025 දී සැමට සෙවණ සාක්ෂාත් කිරීම උදෙසා ඉතා වැදගත් වන මධ්‍යකාලීන සංවර්ධන සැලසුම ද සම්පාදනය කරන ලදි. එහිදී නිවාස අංශයක් ලෙස සමස්ථ දායකත්වය හඳුනා ගැනීම සඳහා නිවාස ක්ෂේත්‍රයේ කටයුතු කරන අනෙකුත් අමාත්‍යාංශ වලද සහභාගිත්වය ලබා ගන්නා ලදී. ඒ අනුව කිසිදු ජන කොට්ඨාශයක් මග නොහැරෙන පරිදි නිවාස සංවර්ධන වැඩසටහන් සකසා දියත් කිරීමේ අභියෝගාත්මක වගකීම නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතට ගැනීමට පියවර ගෙන ඇත.

ඒ අනුව වර්තමානයේදී මෙම අමාත්‍යාංශයේ නිවාස වැඩසටහන තුල අඩු ආදායම්ලාභි සහ අන්ත දිළිඳු යන ආදායම් මට්ටම් ද්විත්වයම සැලකිල්ලට ගනිමින් නිවාස ණය හා ආධාර වැඩසටහන් දියත් කෙරෙන අතර එහිදී කාන්තා මූලික පවුල්, හදුනානොගත් කාලීක වකුගඩු රෝගයෙන් පෙළෙන පවුල්, උතුරු නැගෙනහිර යුද්ධයෙන් පීඩාවට පත් වු පවුල්, ආදී වශයෙන් සමාජ, ආර්ථික ක්‍රියාවලිය තුළ පසුබෑමට ලක් වු සියළු ජන කොටස් සැලකිල්ලට ගෙන ඇත.

මෙම නව ප්‍රවේශය තුළ රටේ නිවාස සංවර්ධන අවශ්‍යතාවය ජාතික සංවර්ධන ක්‍රියාවලිය තුළ අප කෙතරම් ඔසවා තැබීමට සමත් වුයේද යත් සමස්ත අයවැයෙහි ප්‍රාග්ධන යෙදවුම් වලින් මෙම අමාත්‍යාංශය සඳහා වෙන් කල මුදල් ප්‍රමාණය 2016 වසරෙහි රු.මි.6,442 ක් වු අතර එය 2017 වර්ෂයෙහි රු.මි. 6,791 ක් දක්වා ඉහළ නංවා ගැනීමට සමත් වීම තුළින් පැහැදිලි වේ.

ඉදිකිරීම් අංශය වෙනම ගත් කළ රටෙහි ඉදිකිරීම් කර්මාන්තයේ සිදු වූ මෑතකාලීන ප්‍රසාරණයට සමගාමීව එම කර්මාන්තය මුහුණදුන් අභියෝග රැසකි. ඉදිකිරීම් කර්මාන්තයේ නිපුණ ශිල්පීන්ගේ හිගය ඒ අතරින් ඉතා ප්‍රමුඛ විය. එබැවින් 2016 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය සමග ඒකාබද්ධව දියත් කල ඉදිකිරීම් ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන 2017 වර්ෂයේදීද ක්‍රියාත්මක කල අතර එමගින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 2/3) සහිත ශිල්පීන් 2401 ක ප්‍රමාණයක් ඉදිකිරීම් කර්මාන්තය වෙත මුදා හැරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. ඊට අදාල ක්‍රියාත්මක වැඩසටහන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය හරහා සිදු කරන ලදි. තවද ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය සකස් කොට ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව ප්‍රකාශයට පත් කරණ ලදි.

## 2.අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර

### දැක්ම

"තිරසාර ජනාවාස සංවර්ධනයක් හා ඉදිකිරීම් කර්මාන්තයේ පුනර්ජීවයක්"

### මෙහෙවර

ශ්‍රී ලාංකීය ව්‍යවසායකයින් වෘත්තීයවේදීන් හා ශ්‍රමබලකාය හැකියාවන් හා සම්පත් වලින් සන්නද්ධ කරමින් සැලසුම්ගත පරිසර හිතකාමී හා ගුණාත්මක ඉදිකිරීම් කර්මාන්තයක් ඇති කිරීම හා ප්‍රජා සහභාගිත්වයෙන් මූලික පහසුකම් සහිත ජනාවාස බිහිකිරීම හරහා අඩු ආදායම්ලාභී ජනතාව ආර්ථික, සමාජීය හා සංස්කෘතික අතින් සවිබල ගැන්වීම තුළින් ආර්ථික සංවර්ධනයට දායක වීම.

## 3. අමාත්‍යාංශ විෂය පථය හා ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්

නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිපත්ති හා සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අදාළ ආයතන සඳහා මාර්ගෝපදේශ සැපයීම.

# 3.1 අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන්



## නිවාස අංශය

1. අඩු ආදායම්ලාභී සහ විශේෂ ප්‍රජා කණ්ඩායම්ද ඇතුලුව මහජනතාවගේ නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නිවාස යෝජනා ක්‍රම සහ නිවාස මූලාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

2. පරිසර හිතකාමී ලෙස වියදමට සරිලන ප්‍රතිලාභ ගෙන දෙන තැනීමේ තාක්ෂණ ක්‍රම පිළිබඳව ග්‍රාමීය ජනතාවට මඟපෙන්වීම.

3. නිවාස විෂයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.


## ඉදිකිරීම් අංශය

1. ඉදිකිරීම් විෂයට අදාළ , වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇඟයීම.

2. ඉදිකිරීම් කර්මාන්තයට උපදේශක නියාමන සේවා සැපයීම සහ බර ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කරවීම හා නඩත්තු පිළිබඳ පුහුණුව.

3. ඉදිකිරීම් කර්මාන්තයට අදාලව නීතිරීති හා ප්‍රමිති හඳුන්වාදීමට පියවර ගැනීම හා ඒ අනුව ක්ෂේත්‍රයේ කටයුතු නියාමනය, විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය.

# 4.අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය හා මානව සම්පත් පැතිකඩ




ගණ - ගණකාධිකාරි
නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.ලේ. - සහකාර ලේකම්
ස.අ. - සහකාර අධ්‍යක්ෂ

නී.නි. - නීති නිලධාරි
ප.නි. - පරිපාලන නිලධාරි
පරි. - පරිවර්තක
තො.තා.නි. - තොරතුරු තාක්ෂණ නිලධාරි

සං.නි. - සංවර්ධන නිලධාරි
තා.නි. - තාක්ෂණ නිලධාරි
ප්‍ර.ස. - ප්‍රමාණ සමීක්ෂක


ක.ස. - කළමනාකරණ සහකාර
රි. - රියදුරු
කා.කා.ස. - කාර්යාල කාර්යය සහායක

# 5. අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය

| අ.අ. | | වැටුප් ක්‍රමය | අදාල වන සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | ලේකම් | SL 4 | | 01 |
| 2 | අතිරේක ලේකම් (පාලන) | SL 3 | ශ්‍රී.ලං.ප.සේ.විශේෂ | 01 |
| 3 | අතිරේක ලේකම් (නිවාස හා සංවර්ධන) | SL 3 | ශ්‍රී.ලං.ප.සේ.විශේෂ | 01 |
| 4 | අතිරේක ලේකම් (තාක්ෂණ) | SL 3 | ශ්‍රී.ලං.ඉ.සේ. විශේෂ | 01 |
| 5 | ප්‍රධාන මූල්‍ය නිලධාරි | SL 3 | ශ්‍රී.ලං.ග.සේ.විශේෂ | 01 |
| 6 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ. I | 01 |
| 7 | අධ්‍යක්ෂ (නිවාස) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ. I | 01 |
| 8 | අධ්‍යක්ෂ (ඉදිකිරීම් තාක්ෂණ) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ. I | 01 |
| 9 | අධ්‍යක්ෂ (සැලසුම්) | SL 1 | ශ්‍රී.ලං.ක්‍ර.සේ. I | 01 |
| 10 | අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ. I | 01 |
| 11 | අධ්‍යක්ෂ (නාගරික ජනාවාස) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ. I | 01 |
| 12 | ප්‍රධාන ගණකාධිකාරි | SL 1 | ශ්‍රී.ලං.ග.සේ. I | 01 |
| 13 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SL 1 | ශ්‍රී.ලං.ග.සේ. I | 01 |
| 12 | නිවාස කොමසාරිස් | SL 1 | - | 01 |
| 13 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (නිවාස) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ. II / III | 02 |
| 14 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ඉදිකිරීම් තාක්ෂණ) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ. II / III | 01 |
| 15 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | SL 1 | ශ්‍රී.ලං.ක්‍ර.සේ. II / III | 01 |
| 16 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | SL 4 | ශ්‍රී.ලං.ඉ.සේ. II / III | 01 |
| 17 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) | SL 1 | ශ්‍රී.ලං.ඉ.සේ. II / III | 01 |
| 18 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (නාගරික ජනාවාස) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ. II / III<br>ශ්‍රී.ලං.ඉ.සේ. II / III | 01<br>01 |
| 19 | සහකාර ලේකම් (පාලන) | SL 1 | ශ්‍රී.ලං.ප.සේ. III | 03 |
| 20 | ගණකාධිකාරි | SL 1 | ශ්‍රී.ලං.ග.සේ. II / III | 02 |

| | | | | |
|---|---|---|---|---|
| **21** | නීති නිලධාරි | SL 1 | දෙපාර්තමේන්තුගත | 01 |
| **22** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | SL 1 | ශ්‍රී.ලං.තො.තා.සේ.2/II | 01 |
| **23** | පරිපාලන නිලධාරි | MN 7 | රා.ක.ස.සේ.(අධි) | 01 |
| **24** | ලේකම්ගේ සම්බන්ධිකරණ ලේකම් (තාවකාලික තනතුරකි) | MN 6 | | 01 |
| **25** | භාෂා පරිවර්තක | MN 6 | භාෂා පරිවර්තක සේවය | 02 |
| **26** | අයවැය සහකාර | MN 4 | ආශ්‍රිත නිලධාරි | 01 |
| **27** | සැපයුම් සහකාර | MN 4 | ආශ්‍රිත නිලධාරි | 01 |
| **28** | සංවර්ධන සහකාර | MN 4 | ආශ්‍රිත නිලධාරි | 25 |
| **29** | නිවාස සංවර්ධන සහකාර | MN 4 | ආශ්‍රිත නිලධාරි | 11 |
| **30** | සංවර්ධන නිලධාරි | MN 4 | ආශ්‍රිත නිලධාරි | 19 |
| **31** | කළමනාකරණ සහකාර | MN 4 | රා.ක.සේ. | 43 |
| **32** | කාර්මික නිලධාරි | MT 2 | ශ්‍රී.ලං.තා.සේ. | 05 |
| **33** | ප්‍රමාණ සමීක්ෂක | MT 2 | ශ්‍රී.ලං.තා.සේ. | 01 |
| **34** | රියදුරු | PL 3 | රියදුරු සේවය | 26 |
| **35** | කාර්යාල කාර්යය සහායක | PL 1 | කා.සේ.සේ. | 26 |
| **36** | වීඩියෝ කැමරාකරු (තාවකාලික) | | | 01 |
| **37** | නිශ්චල ඡායාරූප ශිල්පි (තාවකාලික) | | | 01 |
| **38** | කාර්යාල ශිල්පි සහායක (තාවකාලික) | | | 01 |
| | **මුළු තනතුරු සංඛ්‍යාව** | | | **193** |

# 6. අමාත්‍යාංශයේ ව්‍යුහය



## 6.1 පාලන අංශය

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදීත්, මහජන සුභසිද්ධිය පිණිස සිදු කරනු ලබන විවිධ කර්තව්‍යයන්හිදීත්, අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා සහාය ලබාදීමත් ඒ සඳහා අවශ්‍ය වැඩ පරිසරය සකස් කිරීම, මානව සම්පත් මෙන්ම භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීම පාලන අංශය මගින් සිදු කරනු ලබයි.

### පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ සේවය කරන සියලුම නිලධාරීන්ගේ ආයතනික කටයුතු පවත්වාගෙන යෑම.
2. අමාත්‍යාංශයේ සියලුම නඩත්තු කටයුතු සිදුකිරීම.
3. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු ඉටුකිරීම.
4. අමාත්‍යාංශය හා අනුබද්ධිත ආයතන වල අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදුකරන සියලුම පරිපාලන කටයුතු.
5. අමාත්‍යාංශයේ කාර්යයමණ්ඩලය සම්බන්ධ කටයුතු.
6. අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා අවශ්‍ය පහසුකම් සපයාදීම.
7. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.
8. ඵලදායිතා ක්‍රියාකාරකම් සිදුකිරීම.
9. අමාත්‍යාංශයේ කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම.
10. අමාත්‍යාංශ නිලධාරීන් සඳහා පුහුණු සැසි පැවැත්වීම.

## 6.2 සැලසුම් අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ සැලසුම්කල පරිදි ප්‍රගතිය ලගාකර ගැනීම සඳහා මෙහෙයවීම.

නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිදුකරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳ නිවැරදි තොරතුරු ලබාදීම මගින් අදාල පාර්ශව හා මහජනතාව දැනුවත් කිරීම.

නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සංවර්ධන අවශ්‍යතා හදුනාගෙන ආයතන වලින් සකස් කරන ව්‍යාපෘති යෝජනා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය මගින් අනුමත කරවා ගැනීමට සහායවීමත් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් පසුවිපරම් කිරීම හා ඇගයීම් කිරීමත් සැලසුම් අංශය මගින් සිදු කරනු ලබයි.

### සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශයේ දැක්ම හා අරමුණු වලට අදාලව අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු.
2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය මාසිකව හා වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්මට අනුව ඇගයීම.
3. සංවර්ධන වැඩසටහන් සම්බන්ධ තොරතුරු සම්පාදනය හා වාර්තාකරණය.
4. අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන වල ව්‍යාපෘති යෝජනා, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණය.
5. ව්‍යාපෘති පසුවිපරම් කිරීම හා ඇගයීම.
6. අමාත්‍යාංශයට හා අනුබද්ධ ආයතන වලට අදාල අමාත්‍යමණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කිරීම.
7. වාර්ෂික ප්‍රගති වාර්තා හා කාර්යය සාධන වාර්තාව පිළියෙල කිරීම.
8. ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම හා පසුවිපරම.

## 6.3 නිවාස අංශය

නිවාස ක්ෂේත්‍රයේ අරමුණු ලඟා කර ගැනීම සඳහා නිවාස සංවර්ධනය යන විෂය ක්ෂේත්‍රයන් යටතේ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, මෙහෙයවීම, පසුවිපරම් කිරීම සහ ක්ෂේත්‍රයේ නියැලෙන අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන සඳහා මගපෙන්වීම. මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

## නිවාස අංශයේ ප්‍රධාන කාර්යයන්

### 1. ප්‍රතිපත්ති සම්පාදනය

- නිවාස ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති සම්පාදනය.
- නිවාස ක්ෂේත්‍රයට අදාල වන ප්‍රතිපත්ති අනෙකුත් රාජ්‍ය ආයතන සමග සහ සම්බන්ධ වී ක්‍රියාත්මක කරවීම.
- අඩු පහසුකම් සහිත ජනාවාස සංවර්ධනය කිරීම හා ප්‍රජාව සංවර්ධනය කිරීම.
- දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ගැමි නිවාස කමිටු ස්ථාපිත කිරීම.
- ලෝක ජනාවාස දිනයට සමගාමීව දිවයින පුරා නිවාස ඉදිකිරීම් හා සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ලෝක ජනාවාස දිනය සැමරීම.

### 2. ඉඩම් රාජකාරි

- නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම / පවරා ගැනීම සම්බන්ධ කටයුතු
- නිවාස සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා ඉඩම් බැහැර කිරීම සම්බන්ධ කටයුතු
- ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනතේ 8(1) වගන්තිය යටතේ ඉඩම්/නිවාස වල නීතිමය අයිතිය ජනතාවට පවරා දීම.
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු ඉඩම් වල අනවසරයෙන් නිවාස ඉදිකර පදිංචි වී ඇති පදිංචිකරුවන්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව නියමානුකූල කිරීම.

### 3. නිවාස සංවර්ධනය

- රටේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි නිවාස ඉදිකිරීමේ වැඩසටහන් හා නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- මහල් නිවාස ප්‍රතිසංස්කරණය කිරීම.
- නිවාස ණය ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නිවාස යෝජනා ක්‍රමවලට අදාල අමාත්‍යමණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම.
- වෙනත් රාජ්‍ය ආයතන හා ඒකාබද්ධ නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශීය හා විදේශීය ආයෝජකයින් සමග නිවාස ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම.
- අඩු පහසුකම් සහිත ජනාවාස සංවර්ධනය කිරීම හා ප්‍රජාව නගා සිටුවීම.

## 6.4 තාක්ෂණ අංශය

### 6.4.1. ඉංජිනේරු සේවා අංශය

ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා සාධාරණ හා දැරිය හැකි මිල ගණන් නියම කිරීම තුළින් සමස්ත ඉදිකිරීම් කර්මාන්තයේ, මුළු ඉදිකිරීම් පිරිවැය පාලනය කිරීමත් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා විනිවිද භාවයකින් යුතුව සාධාරණ මිල ගණන් අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට සහාය වීමත් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

### ඉංජිනේරු සේවා අංශයේ ප්‍රධාන කාර්යයන්

1. රජයේ ආයතන වල ඉදිකිරීම් සම්බන්ධ ස්ථාවර තාක්ෂණ කමිටු අනුමැතිය ලබාදීම.
2. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.
3. කොන්ත්‍රාත් විචලනයන් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබාදීම.
4. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදීම.
5. කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධව ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල දත්ත පද්ධති හා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල මිල ගණන් පිළිබඳ දත්ත පද්ධති පවත්වා ගෙන යාම.

## 6.4.2 ඉදිකිරීම් තාක්ෂණ අංශය

පරිසර හිතකාමී හා ගුණාත්මක ඉදිකිරීම් කර්මාන්තයක් බිහි කිරීමට අමාත්‍යාංශය යටතේ ඇති ආයතන මෙහෙයවීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

### ඉදිකිරීම් තාක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන්

1. ඉදිකිරීම් අංශයට අනුබද්ධිත ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා සපයන ආයතන ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රගමනය සඳහා මෙහෙයවීම.
2. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රම බලකාය සුදානම් කිරීම.
3. වෘත්තීයවේදීන් හා ඉදිකිරීම් ශිල්පීන් නිපුණතාවයෙන් හා දැනුමෙන් පරිපූර්ණ කිරීමට හා ගුණාත්මක ඉදිකිරීම් සිදු කිරීමට අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මෙහෙයවීම.
4. අවශ්‍ය අවස්ථාවන්හිදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

## 6.4.3. නාගරික ජනාවාස අංශය

ප්‍රධාන වශයෙන් නාගරික ප්‍රදේශයන්හි වාසය කරනු ලබන අඩු ආදායම්ලාභී ජනතාවට හා අනෙකුත් ජනතාවට අවශ්‍ය පරිදි පදිංචි වීමට හැකියාව පවතින, පහසුකම්වලින් සමන්විත නිවාස ව්‍යාපෘති ඉදිකිරීම් මෙහෙයවීම හා නාගරික ජනාවාස සංවර්ධනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

### නාගරික ජනාවාස අංශයේ ප්‍රධාන කාර්යයන්

1. නාගරික ජනාවාස ව්‍යාපෘති හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතන වෙත අවශ්‍ය සහයෝගය ලබාදීම හා තාක්ෂණික මගපෙන්වීම.
2. නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.

## 6.5 ජාතික නිවාස කොමසාරිස් අංශය

මෙම අංශය 1973 අංක 01 දරණ නිවාස දේපළ උපරිමය නීතිය යටතේ ලබා දී ඇති බලතල හා කාර්යයන් ඉටු කරයි. එමෙන්ම 1972 අංක 7 දරණ කුලී පනත යටතේ පැවරී ඇති යම් කාර්යයන් ද ඉටු කරයි. ඉහත නීති මගින් දක්වා ඇති ප්‍රධාන අරමුණ වන කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම, රජයට පවරා ගත් නිවාසවල අයිතිකරුවන්ට වන්දි ලබා දීම වැනි අරමුණු සඳහා මෙම අංශය ක්‍රියා කරයි.

### ජාතික නිවාස කොමසාරිස් අංශයේ ප්‍රධාන කාර්යයන්

1. කුලී නිවැසියන් සඳහා ඔප්පු ලබා දීම.
2. රජයට පවරාගත් නිවාසවල හිමිකරුවන් සඳහා වන්දි ලබාදීම.
3. පොදු පහසුකම් සඳහා වෙන් කොට ඇති කොටස් සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු නිරාකරණය කිරීම.

## 6.6 මූල්‍ය අංශය

අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලට අදාල වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හා උපදේශනය ලබා දීමත්, එම සම්පත් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව යෙදවීම සඳහා අවශ්‍ය වන පද්ධති හා පාලන ක්‍රම පිළිබඳව උපදෙස් ලබාදීමත් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

### මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අරමුදල් පිළිබඳව සැලසුම් කිරීම.
2. අයවැයකරණය
3. අරමුදල් නිසි ප්‍රමාණයට, නිසි වේලාවට ලබාගැනීම.
4. අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් නිකුත් කිරීම හා වියදම් කිරීම.
5. අදාල පාර්ශවයන් වෙත වියදම හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳව නියමිත දිනයන්ට හෝ ඊට පෙර වාර්තා කිරීම.

## 6.7 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති / අනුබද්ධ ආයතනවල අපේක්ෂිත අරමුණු යථාර්තයක් බවට පත් කර ගැනීම පිණිස යහපත් මූල්‍ය පරිපාලනයක් සහ විධිමත් කළමනාකරණයක් ස්ථාපිත කිරීම.

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවල මූල්‍ය පරිපාලනය හා කළමනාකරණ කටයුතුවලට සහභාගී වී එම කටයුතු වඩාත් විධිමත් සහ කාර්යක්ෂමතාවයකින් යුතුව සිදුකිරීම පිණිස කළමනාකරණයට මග පෙන්වීමෙන් සහ අවශ්‍ය උපදෙස් ලබා දීමෙන් සහායවීම.

### අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල විගණන කටයුතු සම්බන්ධීකරණයක් ඇති කිරීම.
2. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් මඟින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල ගැටලු අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම.
3. විගණන හා විමර්ශන කටයුතු තුළින් ආයතන වල ඇති ගැටලු අවම කර ගැනීමට සහාය වීම.
4. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම.

# 7 .අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන

## 7.1 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකාවේ නිවාස අවශ්‍යතාවයන් ඇති සෑම ජන කොට්ඨාශයකටම මූලික පහසුකම් සහිත සුරක්ෂිත නිවසක් හිමිකරදීමේ අරමුණින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කටයුතු කරනු ලැබේ. අඩු ආදායම්ලාභී පවුල් වල නිවාස අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා උනන්දු කරවීම, පහසුකම් සැලසීම, සහ සම්බන්ධීකරණය කිරීම තුළින් ආර්ථික සමෘද්ධිය ළඟා කරදීම සඳහා 1979 අංක 17 දරණ "ජාතික නිවාස සංවර්ධන අධිකාරී පනත" මගින් ස්ථාපිත කරන ලද අතර වර්තමානයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන ආකාරයට කාර්යාල පිහිටුවා ඇත.

## 7.2 නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

තිරසාර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇති වන බවට සහතික කිරීමේ අරමුණින් අඩු පහසුකම් සහිත නාගරික ජනාවාස ආශ්‍රිතව ජීවත් වන ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබාදීම, ප්‍රජාව ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් බලගැන්වීම හා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම ආදී කාර්යයන් සඳහා 2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනත ස්ථාපිත කරන ලදි.

## 7.3 සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය

සහාධිපත්‍ය දේපල පදිංචිකරුවන්ගේ ප්‍රතිලාභය හා සුභසාධනයට ගැලපෙන පරිදි ඉදිකිරීම හා එම දේපල ක්‍රමවත්ව පාලනය හා කළමනාකරණ සංස්ථා පිහිටුවා දේපල නඩත්තු කරවීම යන කාර්යයන් නියාමනය සඳහා 2003 අංක 24 දරණ පොදු පහසුකම් මණ්ඩල (සංශෝධිත) පනත මගින් නියාමන අධිකාරියක් ලෙස සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය ස්ථාපිත කරණ ලදි. තවද 1982 අංක 45, 2003 අංක 39 යන පනත් වලින් සංශෝධිත බද්ධ නිවාස අයිතිකම් පනතේ නියමයන් නියාමනය කිරීම මෙහි මූලික අරමුණ වේ.

## 7.4 ඔෂන් ව්ව් සංවර්ධන පුද්ගලික සමාගම

ශ්‍රී ලංකාවේ දේපල සංවර්ධන වෙළඳපොල තුළ ප්‍රමුඛතම දේපළ සංවර්ධන සමාගම බවට පත්වීමේ අරමුණින් 1982 අංක 17 දරණ සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇත.(ලි.ප.අංක - PV 17667) පසුව එය 2007 අංක 07 දරණ සමාගම් ලියාපදිංචි කිරීමේ පනතට අනුව නැවත ලියාපදංචි කිරීම සිදු කර ඇත. පුද්ගලික ආයතනයක් ලෙස කාර්යක්ෂමතාවය පෙරදැරි කරගත් මෙම සමාගම වර්තමානය වන විට නිවාස ක්ෂේත්‍රයෙහි කැපී පෙනෙන වෙනසක් ඇති කරමින් නිවාස අවශ්‍යතාවය සපුරාලීමට කටයුතු කරමින් සිටී.

## 7.5 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

1849 වර්ෂයේදී රජයේ වැඩ දෙපාර්තමේන්තුව ලෙසින් ආරම්භ වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී "ඒ" කාණ්ඩයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරනු ලැබූ අතර රජයේ වැඩ දෙපාර්තමේන්තුව අහෝසි කිරීමෙන් අනතුරුව රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ එකම අධිකාරි ආයතනය සහ උපදේශක ආයතනය ලෙස සලකනු ලැබේ.

දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාල 27 ක් මගින් දිවයින පුරා වාස්තු විද්‍යාත්මක සහ ඉංජිනේරුමය නිර්මාණ, ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික උපදෙස් සැපයීම මගින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙස් විශිෂ්ඨ සේවාවක් සපයනු ලැබේ.

## 7.6 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන සඳහා යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ ලෝහ හා වඩු කර්මාන්ත ආශ්‍රිත වැඩ, භාණ්ඩ හා සේවා සැපයීමේ කාර්යයන් සහ යාන්ත්‍රික ඉංජිනේරුවන් සඳහා වැඩහල නිෂ්පාදන සහ වැඩ සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබාදීමේ අරමුණින් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි.

## 7.7 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

2014 අංක 33 දරණ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන යටතේ මෙම අධිකාරිය පිහිටුවා ඇත. ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම විධිමත් කිරීම හා ප්‍රමිතිකරණය කිරීම මෙම පනතෙහි ප්‍රධාන අරමුණ වේ.

ඉදිකිරීම් කර්මාන්තය සඳහා ජාතික උපදේශක සභාවක් පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල පිහිටුවීම, ඉදිකිරීම් කර්මාන්තයට අදාල වෘත්තිකයින්, නිෂ්පාදකයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම, ඉදිකිරීම් කටයුතු වලට අදාල ආරවුල් නිරවුල් කිරීම, ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම ආදී කාර්යයන් සඳහා අධිකාරිය කටයුතු කරනු ලැබේ.

## 7.8 රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන අර්ධ රාජ්‍ය ආයතනයකි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උපදේශන සේවා ලබාදීම, ඉංජිනේරු සේවා සැපයීම, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සැපයීම, සැලසුම් නිර්මාණය, පෙරසවි/පෙරැදි කොන්ක්‍රීට් උපාංග නිෂ්පාදනය කිරීම, පුහුණුව ලබාදීම මෙන්ම පර්යේෂණ කටයුතු සිදු කරනු ලබයි.

2009 වසරේ සිට ISO 9001:2000 තත්ත්ව සහතිකයෙන් හා ISO 14001:2004 පරිසර කළමනාකරණ සහතිකයෙන්ද පිදුම් ලබා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි.

## 7.9 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය

රාජ්‍ය ආයතන සඳහා පස් තැලීමේ යන්ත්‍රෝපකරණ සැපයීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය 1992 වසරේ දී පිහිටුවන ලදි. 2011 වසරේදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ යන්ත්‍රෝපකරණ අංශය ලෙස ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ඒ යටතට ගනු ලැබූ අතර 2016 වසරේ ජනවාරි මාසයේ දී නැවත වරක් අමාත්‍යමණ්ඩල තීරණයක් මගින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යටතේම කළමනාකරණ මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වේ.

වනජීවී, සත්වෝද්‍යාන, වාරිමාර්ග, වෙරළ සංරක්ෂණ සහ දුම්රිය ආදී දෙපාර්තමේන්තු විසින් ප්‍රදානය කරනු ලබන විශේෂිත කොන්ත්‍රාත් මගින් මෙම ආයතනය ඉදිරියට යමින් සිටියි. මුද්‍රණ වෘත්තිකයින්, පුහුණු සේවකයන් සහ කම්කරු මට්ටමේ සේවකයන් 609 කින් සැදුම්ලත් කාර්යය මණ්ඩලයකින් සමන්විතය.

තවද ආයතනය බර යන්ත්‍රෝපකරණ ඇණියක් සහ දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක සඳහා සේවය සපයන ඩිපෝ පද්ධතියකින් මෙන්ම දිවයිනේ සෑම පළාතකම පිහිටි සියළු පහසුකම් වලින් සමන්විත යාන්ත්‍රික වැඩහල් වලින් යුක්තය.

## 7.10 රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව.

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1971 ඔක්තෝම්බර් 01 වන දින ඉංජිනේරු සංවිධානයක් ලෙස ස්ථාපිත කරන ලද අතර, මේ වන විට නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ප්‍රධාන පෙළේ ඉංජිනේරු ආයතනයක් ලෙස පාලම්, මාර්ග, ගොඩනැගිලි, උමං, වාරි මාර්ග හා ජල සම්පාදන යෝජනා ක්‍රම යනාදිය සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා ඉදිකිරීම තුළින් මෙරට යටිතල පහසුකම් සංවර්ධනයට සුවිශේෂී දායකත්වයක් සපයන අතරම පාලම් ඉදිකිරීම සම්බන්ධව ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධානතම ආයතනයක් ද වේ. එසේම උමං ඉදිකිරීමට හැකියාවක් ඇති එකම ශ්‍රී ලාංකික ආයතනය ද මෙම සංස්ථාවයි.
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් මෙම සංස්ථාව C1 ශ්‍රේණියේ ඉදිකිරීම් ආයතනයක් ලෙස ලියාපදිංචි කර ඇති අතර, එම ආයතනය මගින් පිරිනමන ලද ඉදිකිරීම් කාර්යය සාධනය පිළිබඳ සම්මාන ද දිනා ඇත.

ISO 9001-2008 තත්ත්ව සහතිකයද හිමි කර ඇති මෙම සංස්ථාව ඉදිකිරීම් නියමිත ප්‍රමිතියටම ගෙන සිදු කරනු ලබයි.

ඉංජිනේරුමය කාර්යයන් සඳහා කොන්ක්‍රීට් පාලම්, බාල්ක, විදුලිකණු,සහ අනෙකුත් සියලුම පෙරසවි (පෙරදි) කොන්ක්‍රීට් නිෂ්පාදන කරනු ලබයි. මීට අමතරව, මාර්ග සංවර්ධන අධිකාරියේ සියලුම මාර්ග සංඥා පද්ධති නඩත්තු කිරීම සහ නව පද්ධති සවි කිරීම ද සංස්ථාව මගින් සිදු කරනු ලබයි.

## 7.11 ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව

1970 අංක 33 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය නීතිගත සංස්ථා පනත යටතේ 1971 වර්ෂයේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව ස්ථාපනය කරන ලදි. 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර රාජ්‍ය සමාගම් බවට පත් කිරීම පිළිබඳ පනත යටතේ සහ 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1992 වර්ෂයේ දී 100% රජය සතු සී/ස වගකීම් සහිත සමාගමක් බවට මෙම සංස්ථාව පත්කරණ ලදි. 2007 වර්ෂයේදී සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සමුපකාර සහ අභ්‍යන්තර වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතට පත් විය. නැවත 2010 වර්ෂයේ මාර්තු මාසයේදී 2007 සමාගම් පනතේ අංක 07 යටතේ නැවත ලියාපදිංචි කරන ලදි.

දිවයින පුරා තරඟකාරී මිලකට ප්‍රමිතියෙන් යුත් ගොඩනැගිලි ද්‍රව්‍ය සහ උපකරණ සැපයීමේ ප්‍රමුඛයා වෙමින්, ප්‍රජාවගේ විශ්වාසය දිනාගනිමින්, රාජ්‍ය ආයතනයක් වශයෙන් සමාජ වගකීම ඉටුකරනු ලබයි.

# 8.මුල්‍ය ප්‍රතිපාදන

2017 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද සමස්ථ මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය හා එම මුල්‍ය ප්‍රතිපාදනයන්හී 2017-12-31 දිනට ප්‍රගතිය පහත දක්වා ඇත.

## ➢ අමාත්‍යාංශයේ සමස්ථ මුල්‍ය ප්‍රගතිය

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.) | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | තථ්‍ය වියදම (රු.) |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 436,606,000.00 | 683,978,131.00 | 681,823,650.00 |
| ප්‍රාග්ධන වියදම් | 2,323,650,000.00 | 6,849,150,000.00 | 6,849,149,973.00 |
| එකතුව | **2,760,256,000.00** | **7,533,128,131.00** | **7,530,973,623.00** |

## ➢ වැඩසටහන් අනුව

වැඩසටහන් 1 - මෙහෙයුම් ක්‍රියාකාරකම්

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.) | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | තථ්‍ය වියදම (රු.) |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 226,116,000.00 | 467,943,131.00 | 467,812,650.00 |
| ප්‍රාග්ධන වියදම් | 11,450,000.00 | 11,650,000.00 | 11,649,974.00 |
| එකතුව | **237,566,000.00** | **479,593,131.00** | **479,462,624.00** |

වැඩසටහන් 2 - සංවර්ධන ක්‍රියාකාරකම්

| | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.) | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | තථ්‍ය වියදම (රු.) |
|---|---|---|---|
| පුනරාවර්ථන වියදම් | 210,490,000.00 | 216,035,000.00 | 214,011,000.00 |
| ප්‍රාග්ධන වියදම් | 2,312,200,000.00 | 6,837,500,000.00 | 6,837,500,000.00 |
| එකතුව | **2,522,690,000.00** | **7,053,535,000.00** | **7,051,511,000.00** |

# රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

**ගිණුම් අංකය** - 123011
- 123012

| | | |
|---|---|---|
| **අනුමත සීමාවන්** | - **වියදම් උපරිම සීමාව** | - රු.11,000,000.00 |
| | - **අවම ලැබීම් සීමාව** | - රු. 5,500,000.00 |
| | - **උපරිම හර ශේෂ සීමාව** | - රු.45,000,000.00 |

**වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙනා ශේෂය (2017.01.01) රු.23,581,143.50**

| | | |
|---|---|---|
| **වර්ෂය තුළ හර කිරීම්** - | 123011 | - රු.10,968,902.50 |
| | 123012 | - රු. 1,756,853.00 |
| **වර්ෂය තුළ බැර කිරීම්** - | 123011 | - රු.8,202,908.32 |
| | 123012 | - රු.4,097,512.00 |

**වර්ෂය අවසානයේ ශේෂය(2017.12.31) රු.24,006,478.68**

# 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති කිහිපයක්



අනතුරකට ලක් වූ පාසල් දරුවකුගේ නිවාස ගැටළුව විසඳීම සඳහා දායක වීම



සූරියවැව සොමිරිවිගම ජනතා අයතියට පත්කරමින්



උතුරු පළාත් නිවාස ව්‍යාපෘතිය යටතේ ආදර්ශ ගම්මානයකට මුල්ගල තැබීම



මලල ක්‍රීඩිකාවකගේ නිවාස ගැටළුව විසඳමින් නිවසක අයිතිය තහවුරු කිරීම.



ශිල්ප සවිය ඉදිකිරීම් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ ආයුධ කට්ටල බෙදාදීම




2017 ලෝක ජනාවාස දිනය සමරමින්

# 9. වර්ෂය තුළ අමාත්‍යාංශයේ ප්‍රගතිය.

## 9.1 පාලන අංශය

❖ **අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩලය**

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය සඳහා 2017 වර්ෂය අවසාන වන විට අනුමත සමස්ත කාර්ය මණ්ඩලය 193 ක් වූ අතර මෙම වර්ෂය තුළ සංඛ්‍යාලේඛන නිලධාරී තනතුරක් හා ශ්‍රී ලංකා පරිපාලන සේවයට අදාල සහකාර ලේකම් තනතුරක් අනුමත කර ගැනීමට අමාත්‍යාංශයට හැකි විය. එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරණ ලද කාර්ය මණ්ඩල සමාලෝචන උපදෙස් වලට අනුකූලව මෙම අමාත්‍යාංශය සඳහා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට අදාල නව සහකාර අධ්‍යක්ෂ තනතුරක් සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට අදාලව අභ්‍යන්තර විගණක නව තනතුරක් ඇති කර ගැනිම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලද අතර එම තනතුරු 2018 වර්ෂය තුළ අනුමත කර ගැනීමට අපේක්ෂා කෙරේ.
කෙසේ වුවද 2017 වර්ෂය අවසානය වන විට අමාත්‍යාංශය තුළ සේවය කරන ලද සමස්ත කාර්ය මණ්ඩලය 148 ක් වූ අතර එය 2016 වර්ෂයේදී 150 ක්ව පැවතිනි.

❖ **කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු**

අමාත්‍යාංශයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු වන අතිරේක ලේකම් (පාලන), ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන), හා අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) යන තනතුරු වල පැවති පුරප්පාඩු 2017 වර්ෂයේදී සම්පූර්ණ කරගැනීමට අමාත්‍යාංශයට හැකියාව ලැබුණි.

ප්‍රධාන මුල්‍ය නිලධාරි, අධ්‍යක්ෂ (ඉදිකිරීම් තාක්ෂණ) හා අධ්‍යක්ෂ (නාගරික ජනාවාස) යන තනතුරු වල සේවය කල නිලධාරීන් විශ්‍රාම යෑම හේතුවෙන් එම තනතුරු පුරප්පාඩු වූ අතර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ හා ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III වන ශ්‍රේණි වල නිලධාරීන්ගේ හිගය හේතුවෙන් අමාත්‍යාංශයට අනුමතව පවතින සහකාර අධ්‍යක්ෂ (නිවාස), සහකාර අධ්‍යක්ෂ (සැලසුම්), සහ ගණකාධිකාරී යන තනතුරු මෙම වර්ෂය අවසාන වන විට ද පුරප්පාඩුව පැවතිනි.

2017 වර්ෂය අවසානය වන විට අමාත්‍යාංශයේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 45 ක් වූ අතර එය 2016 වර්ෂයේදී 40 ක්ව පැවතිණි.

❖ **අමාත්‍යමණ්ඩල සංදේශ සහ පාර්ලිමේන්තු ප්‍රශ්න**

නිවාස හා ඉදිකිරීම් යන ප්‍රධාන විෂයපථයන්ට අදාළව මෙම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන කාර්යයන් හා පරිපාලනමය කටයුතු සඳහා 2017 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 47 ක් අමාත්‍යමණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. මීට අමතරව අමාත්‍යමණ්ඩල සටහන් 13 ක් ද මෙම වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලදි.

තවද මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් කරුණු සම්බන්ධයෙන් 2012 වර්ෂය තුළදී පාර්ලිමේන්තු ප්‍රශ්න 09 ක් ඉදිරිපත් වී ඇති අතර එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලබාදීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලදි.

❖ **මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම**

මෙම අමාත්‍යාංශයට අදාලව ප්‍රධාන වශයෙන් මහජන ඉල්ලීම් ඉදිරිපත් වන්නේ නිවාස ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන අතර සේවකයින්ගේ ආයතනික ගැටලු සහ වෘත්තීය සමිති ගැටලු සම්බන්ධව පැමිණිලි ද ඉදිරිපත් වේ. විශේෂයෙන්ම ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ මහජන පෙත්සම් කාරක සභාව හරහාද ඉහත ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබයි.

මෙම සියලු ඉල්ලීම් සඳහා මැදිහත් වී කටයුතු කිරීමට අමාත්‍යාංශය නොපමාව කටයුතු කර ඇති අතර ආයතනික සහ වෘත්තීය සමිති ගැටලු සඳහා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් අදාල පාර්ශවයන් සමග සාකච්ජා පවත්වා විසඳුම් ලබාදීමට කටයුතු කර ඇත.

❖ පුහුණු හා ඵලදායීතා ක්‍රියාකාරකම්

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී අමාත්‍යාංශයේ සේවය කරන සියලු සංවර්ධන සහකාරවරුන් / සංවර්ධන නිලධාරීන් හා කළමනාකරණ සහකාරවරුන් ආවරණය වන පරිදි කාර්යාල ක්‍රම හා විෂය කාර්යය පටිපාටිය සම්බන්ධව දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩමුළුවක් සංවිධානය කරන ලද අතර සියලු මාණ්ඩලික නිලධාරීන් සඳහා සේවක අභිප්‍රේරණ වැඩමුළුවක්ද සාර්ථකව පවත්වන ලදි.

මීට අමතරව අමාත්‍යාංශ නිලධාරීන්ගේ දෙමළ භාෂා ප්‍රවීණතාවය වර්ධනය කර ගැනීම සඳහා දෙමළ භාෂා උපකාරක පන්ති පැවැත්වීමට කටයුතු කරන ලද අතර විවිධ පුහුණු ආයතන වලින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් 22 නෙකු යොමු කිරීමටද පියවර ගන්නා ලදි.

තවද රාජ්‍ය වෘත්තීය පුහුණු ආයතනවලින් පාඨමාලා සම්පූර්ණ කර පුහුණුව ලබා ගැනීමට අපේක්ෂිත පුහුණු ලාභීන් 20 දෙනෙකු සඳහා අමාත්‍යාංශය විසින් ඔවුන්ගේ පුහුණු පාඨමාලාවල විෂයන්ට අදාල ප්‍රායෝගික පුහුණුව ලබාදීමටද මෙම වර්ෂයේදී කටයුතු කරන ලදි.

## 9.2 සැලසුම් අංශය

❖ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම හා ප්‍රගති සමාලෝචන රැස්වීම්.

සෑම වර්ෂයකම අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන වල සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාල ක්‍රියාකාරකම් හා ඇස්තමේන්තු ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරනු ලබන අතර 2017 වර්ෂය සඳහාද අමාත්‍යාංශයේ මෙන්ම ඊට අනුබද්ධිත ආයතන වලට අදාල වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලදි.

වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව සංවර්ධන වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණයට හා ඇගයීම සඳහා විෂයභාර ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් 34 ක් හා ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් නිවාස හා තාක්ෂණ අංශ වලට අදාල රැස්වීම් 10 ක් 2017 වර්ෂයේදී පවත්වන ලද අතර, ප්‍රධාන වශයෙන් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ලබාදීමට එමගින් හැකියාව ලැබුණි.

❖ ප්‍රගති වාර්තා.

ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත මාසිකවද ව්‍යාපෘති කළමනාකරණ හා මෙහෙයුම් දෙපාර්තුමේන්තුව වෙත කාර්තුමය වශයෙන්ද ජනාධිපති ලේකම් කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත මාසිකවද ලබාදිය යුතු ප්‍රගති වාර්තා අදාල කාලසීමාවන් තුලදී සැපයීමට පියවර ගන්නා ලදි. ඊට අමතරව ආයතන වල ප්‍රතිඵල පාදක ඇගයීම් වාර්තා සම්බන්ධීකරණය සඳහා ද අවශ්‍ය පියවර ගන්නා ලදි.

❖ නව ව්‍යාපෘති යෝජනා

අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන මගින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමේ අරමුණින් නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රයන්ට අදාලව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති යෝජනා 23 ක්, භාණ්ඩාගාර අරමුදල් ලබාගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයට හැකි විය.

❖ අමාත්‍යාංශයේ ප්‍රගතිය හා ඉදිරි සැලසුම් ඇතුලත් වාර්තාව

සෑම වර්ෂයකම අයවැය විවාද කාරකසභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන අමාත්‍යාංශයේ ප්‍රගතිය හා ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව මෙම වර්ෂයේද අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන්හි ප්‍රගතිය හා ව්‍යාපෘති යෝජනා හා සැලසුම් ද සමගින් සකස් කර නිසි කලට ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශයට හැකි විය.

❖ **සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා විදේශ ආධාර ලබාගැනීම.**

එක් දිස්ත්‍රික්කයකට එක් ව්‍යාපෘතියක් බැගින් දිස්ත්‍රික් 25 තුළ නිවාස 600 ක් ඉදිකිරීම සඳහා සැමට සෙවණ ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතිය සඳහා ඉන්දියනු රජය හා ශ්‍රී ලංකා රජය අතර 2017 ඔක්තෝම්බර් මස 26 වන දින අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව මේ සඳහා රු.මි.300 ක් ආධාර ලැබීමට නියමිතය.

තවද දකුණු පළාත තුළ නිවාස 600 ක් ඉදිකිරීමේ සැමට සෙවණ ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය සඳහා ද 2017 ඔක්තෝම්බර් මස 26 වන දින අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව තවත් රු.මි.300 ක් ආධාර ලැබීමට නියමිතය.

අනුරාධපුර විලච්චිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ඇලපත්ගම ඉදිකිරීමට යෝජිත අතිපූජ්‍ය මාදුළුවාවේ සෝභිත නාහිමිගම ව්‍යාපෘතිය සඳහා ඉන්දියානු රජය විසින් රු.මි.296.50ක පරිත්‍යාගයක් කිරීම තුළින් පවුල් 153 ක් සඳහා නව නිවාස ඉදිකරදීම, බහුකාර්යය ගොඩනැගිල්ලක්, භික්ෂු ආවාසයක් හා දානශාලාවක් ඉදිකිරීම, පුස්තකාලය නවීකරණය, ජල සම්පාදනය, ග්‍රාමීය වැවක් ඉදිකිරීම යනාදි සංවර්ධන කාර්යයන් රැසක් සඳහා මෙම ආධාර මුදල යෙදවීමට කටයුතු කරමින් පවතී.

❖ **ජනාධිපති කාර්යය සාධක බලකා වැඩසටහන**

මේ යටතේ වැඩසටහන් 04 ක් ප්‍රතිලාභී අයිතයට පත්කරනු ලබන සෑම ගම්මානයකම ක්‍රියාත්මක කරනු ලැබේ.

1. ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන
2. වකුගඩු රෝග නිවාරණ වැඩසටහන
3. පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන
4. මත්ද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන

මෙම වැඩසටහන් සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කරනු ලබන අතර මේ තුළින් මතින් තොර පරිසර හිතකාමී ඉහළ ජීවන මට්ටමකින් යුත් ආදර්ශ ගම්මාන නිර්මාණය කිරීම මේ තුළින් අපේක්ෂා කෙරේ.

## 9.3 නිවාස අංශය

❖ **මහජන ඉල්ලීම්**

2017 වර්ෂය තුළ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වූ මහජන ඉල්ලීම් 2757 ක් විෂයානුබද්ධව අදාල ආයතනය වෙත යොමු කොට ඒ පිළිබඳව ඉල්ලුම්කරුවන් දැනුවත් කිරීම සිදුකර ඇත.

තවද "ජනපතිට කියන්න" යටතේ ලැබී තිබූ දුක්ගැනවිලි 1895 ක් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වෙත යොමු කර එම දුක්ගැනවිලි ඉදිරිපත් කල පාර්ශව ඒ සමග දැනුවත් කිරීමටත් දුරකථන ඔස්සේ මහජනයා විසින් සිදුකල තොරතුරු විමසීම් 1200 කට අදාලව විස්තර ලබාදීමත් සිදුකර ඇත.

❖ **පනත් සංශෝධනය**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතට අදාල සංශෝධිත කෙටුම්පත සඳහා නීතිපතිගේ නිර්දේශ ලබාගෙන නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි. එමෙන්ම 1973 අංක 11 දරණ බද්ධ නිවාස අයිතිකම් පනත සංශෝධනයට අදාල යෝජනාවලිය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. තවද 1973 අංක 10 දරණ සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරි පනත සඳහා සාදන ලද රෙගුලාසි 2017/07/05 දිනැතිව අංක 2026/25 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇත.

❖ **ප්‍රතිපත්ති සම්පාදන කාර්යයන්**

නිවාස අවශ්‍යතා පිළිබඳව සිදුකරන ලද දීප ව්‍යාප්ත දත්ත සමීක්ෂණය අනුව සකස් කල අවසන් සමීක්ෂණ වාර්තාව පිටු 87 සහ භාෂා ත්‍රිත්වයෙන් මෙන්ම පිටපත් 1200 කින් මුද්‍රණය කොට සියළුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු අදාල රාජ්‍ය ආයතන වෙත බෙදාහැරීමට කටයුතු කොට ඇත.

ජගත් නිවාස වසරේ 30 වන සැමරුමට සමගාමීව හා කාලීන ප්‍රවණතා මෙන්ම අභියෝග අනුව යමින් ජාතික නිවාස ප්‍රතිපත්තිය ප්‍රතිශෝධනය කිරීම සඳහා පියවර

ගත් අතර ඒ සඳහා පත්කල විද්වත් මණ්ඩලයක් විසින් ඉදිරිපත් කල ජාතික නිවාස ප්‍රතිපත්තියේ අවසන් කෙටුම්පත ගරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි. එම කෙටුම්පත සංශෝධන වලට යටත්ව අමාත්‍යමණ්ඩලය විසින් අනුමත කොට ඇත. ඒ අනුව සංශෝධනය කල කෙටුම්පත නැවත ගරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

නිවාස අංශයට අදාලව 2017 වර්ෂය තුළ අමාත්‍යමණ්ඩල සංදේශ හා සටහන් 22 ක් ඉදිරිපත් කොට ඇති අතර නිවාස වැඩසටහන් සම්බන්ධයෙන් වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ 30 කට අදාලව නිරීක්ෂණ ලබා දී ඇත.
එමෙන්ම නිවාස සංවර්ධන ක්ෂේත්‍රයට අදාලව ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් වාචික පිළිතුරු සකස් කර ඉදිරිපත් කරන ලදි.

❖ **හිමිකම් හෝ අයිතිය පැවරීම.**

ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනතේ 8 (I) වගන්තිය යටතේ ඉඩම් හෝ නිවාස වල නීතිමය අයිතිය බැහැර කිරීමට අදාලව 2017 වර්ෂයේ ප්‍රතිලාභීන් 1857 දෙනෙකු සඳහා ඔප්පු ලබාදීම පිණිස ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

තවද රජයට අයත් සභාධිපත්‍ය හා සභාධිපත්‍ය නොවන දේපල වල අයිතිය ඒවායේ දීර්ඝකාලීනව වාසය කරන පදිංචිකරුවන් වෙත පැවරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම වෙනුවෙන් කාර්යය සාධන බලකායක් අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව පත්කර ඇති අතර ඒ අනුව රාජ්‍ය නිලධාරින් සඳහා වෙන්කරන ලද නිල නිවාස වල හැර වසර 15 වඩා වැඩි කාලයක් රජයට අයත් දේපල වල අඛණ්ඩව පදිංචිව සිටින නිවැසියන් පිළිබඳ තොරතුරු පුවත්පත් දැන්වීමක් මගින් ලබාගෙන ඇත. එයට අදාල ඉදිරි කටයුතු ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සමග ඉටුකරමින් පවතී.

❖ **නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කරන ප්‍රධාන ආයතන වන අතර "සැමට සෙවණ" ආදර්ශ ගම්මාන වැඩසටහන, "විරු සුමිතුරු" නිවාස වැඩසටහන, "සොදුරු පියස" නිවාස වැඩසටහන, උතුරු පළාත් නිවාස වැඩසටහන, වැලිඔය නිවාස වැඩසටහන, වකුගඩු රෝගී නිවාස වැඩසටහන හා "ග්‍රාම ශක්ති" නිවාස වැඩසටහන යනාදිය ඒ අතුරින් ප්‍රමුඛ වේ.

සැමට සෙවණ නිවාස වැඩසටහන යටතේ 2017 වර්ෂය අවසාන වන විට නිවාස 49290 ක වැඩ ආරම්භ කර ඇත.

විරු සුමිතුරු නිවාස වැඩසටහන යටතේ 2017 වර්ෂය අවසාන වන විට නව නිවාස 488 ක හා වැඩි දියුණු නිවාස 425 ක ඉලක්කයක් අපේක්ෂා කලද නව නිවාස 182 ක් හා වැඩි දියුණු නිවාස 51 ක ඉලක්කයක් කරා ලගාවීමට හැකි විය. මේ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් රු.මි.170.128 ක් ප්‍රතිලාභීන් වෙත නිදහස් කර ඇත. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී මතු වූ ගැටළු හේතුවෙන් අපේක්ෂිත ඉලක්කය කරා ලගාවීමට නොහැකි විය.

සොදුරු පියස නිවාස වැඩසටහන යටතේ ණය ලබාදීම් සිදු කරනු ලබන අතර ණය ලබාදෙන ප්‍රධාන නිර්ණායක වන ගෙබිමේ ප්‍රමාණය වර්ග අඩි 750 සිට වර්ග අඩි 1000 දක්වා පුළුල් කල අතර ඒ සඳහා ඉදිරිපත් වූ අයදුම්පත් 19595 ක් බැංකුව වෙත ඉදිරිපත් කර එයින් 4170 ක් සඳහා 2017 වර්ෂයේ ණය අනුමත වී ඇත.

2017 වර්ෂය තුළ නිවාස ඒකක 3671 ක වැඩ ආරම්භ කර ඇති අතර ගම්මාන 31 ජනතා අයිතියට පත් කොට ඇත.

ග්‍රාම ශක්ති ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ 2017 වර්ෂයේ නිවාස ඒකක 1304 ක වැඩ ආරම්භ කර ඇත.

❖ **විසිරි ණය වැඩසටහන**

දිවයින පුරා ජීවත් වන අඩු ආදායම්ලාභී පවුල් වල නිවාස අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම හා අර්ධ නිමි නිවාස වැඩි දියුණු කිරීම මෙම වැඩසටහන මගින් සිදු කරනු ලබයි. රුපියල් ලක්ෂ 2 ක උපරිමටකට යටත්ව සහනදායි ණය මුදලක් ලබාදෙනු ලැබේ. මේ අනුව 2017 වර්ෂය තුළ පවුල් 22943 ක් සඳහා රු.මි.1460.33 ක මුදල් ප්‍රමාණයක් මෙම වැඩසටහන යටතේ ලබා දී ඇත.

❖ **ලෝක ජනාවාස දිනය**

1985 වසරේදී බටහිර ඉන්දීය කොදෙව් දූපත්හි ජැමෙයිකාවේ කිංස්ටන් නුවර පැවති එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස කොමිසමේ සැසිවාරය වෙත එවකට අග්‍රාමාත්‍ය දිවංගත ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමන් විසින් ඉදිරිපත් කල යෝජනාවක් මත පදනම්ව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත් කළ "ලෝක ජනාවාස දිනය" 1986 වසරේ සිට අඛණ්ඩව නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයට අදාලව විවිධ වූ තේමාවන් යටතේ සැමරුම් සිදු කරනු ලැබීය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය සෑම වසරකම ඔක්තොම්බර් මස ප්‍රථම සඳු දින ලෝක ජනාවාස දිනය සැමරීම සිදු කරනු ලබන අතර එය 2017 වසරේ ඔක්තෝබර් මස 02 වන සඳු දිනට යෙදී තිබුණි. මෙම ජාත්‍යන්තර දින සැමරුම නිවාස හා ජනාවාස ක්ෂේත්‍රයේ වඩාත් ඵලදායී වැඩසටහනක් ලෙසින් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජනතාවගේ මූලික අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ක්‍රියාවට නංවනු ලැබීය.

ලෝක ජනාවාස දින 31 වන සංවත්සරය "සරිලන නිවහනක උරුමය සැමට" (Housing Policies Affordable Homes) තේමාව යටතේ 2017 ඔක්තෝම්බර් මස 02 වන දින මාතර සනත් ජයසූරිය ක්‍රීඩාංගනයේදී පැවැත්විය.

2017 ලෝක ජනාවාස දින සැමරුම හා ලෝක ජනාවාස සතිය සම්බන්ධ ක්‍රියාකාරකම් මාතර නගරය කේන්ද්‍ර කොට සිදු කරන ලදී.

ලෝක ජනාවාස දිනය ලොව පුරා ක්‍රියාවට නංවන එක්සත් ජාතීන්ගේ මානව ජනාවාස වැඩසටහනේ ශ්‍රී ලාංකික නියෝජිත ආයතනය වන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් තැපැල් මුල් දින කවරයක් එළි දැක්වීම , අමාත්‍යාංශ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මඟින් සඟරාවක් මුද්‍රණය කිරීම, මාතර දිස්ත්‍රික්කය තුළ ඉදිකෙරෙන ආදර්ශ ගම්මාන විවෘත කිරීම, රුහුණු විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධ නිවාස හා ජනාවාසකරණය සම්බන්ධ ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම, විසිරි නිවාස ණය 100 ක් හා හිමිකම් ඔප්පු 200 ක් ප්‍රදානය කිරීම, ජනාවාසකරණය තේමා කරගනිමින් චිත්‍ර, රචනා, නාට්‍ය තරඟ පැවැත්වීම, ජනාවාසකරණය පිළිබඳ නිලධාරීන්, ප්‍රජාව හා ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම යනාදි වැඩසටහන් රැසකින් සමන්විත විය.

තවද අඩු පහසුකම් ජනාවාසවල පදිංචිකරුවන් සඳහා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන් හා වැඩමුළු සංවිධානය කිරීම, සහාධිපත්‍ය සංකල්පය (මහල් නිවාස හා බද්ධ නිවාස) පිළිබඳව නිලධාරීන්, විශ්වවිද්‍යාල සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, කළමනාකරණ සංස්ථා අතර තරඟ පැවැත්වීම හා හොඳම කළමනාකරණ සංස්ථා සඳහා සහතික පත් ලබාදීම මෙන්ම NVQ පුහුණුලාභීන්ට සහතිකපත් ලබාදීමද මෙයට සමගාමීව දියත් කරන ලදි.

❖ **ගැමි නිවාස කමිටු ස්ථාපිත කිරීම.**

දිවයින පුරා පිහිටි ග්‍රාම නිලධාරි වසම් 14023 න් 2017 වර්ෂය අවසාන වන විට ග්‍රාම නිලධාරි වසම් 9565 ක ගැමි නිවාස කමිටු ස්ථාපිත කර ඇත.

## 9.4 ඉදිකිරීම් තාක්ෂණ අංශය

ඉදිකිරීම් කර්මාන්තයට අදාල වෘත්තීය ආයතන මගින් ඉදිරිපත් කරන සියලුම පනත් කෙටුම්පත් සංශෝධනය කර නිර්දේශ ලබාදීම හා එම ආයතන වල අනෙකුත් ගැටළු සඳහා අදාල කාලසීමාවන් තුල විසඳුම් ලබාදීමට කටයුතු කරන ලදි.

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 17 ක් සඳහා මෙම වර්ෂයේදී නිරීක්ෂණ ලබා දී ඇත. අමාත්‍යාංශයට ඉදිකිරීම් ආයතන වලින් ලැබෙන වීසා ඉල්ලීම් සඳහා නිර්දේශ ලබාදීමේදී විදේශ වෘත්තිකයින් 22 ක් හා නේපාල ශ්‍රමිකයින් 89 ක් සඳහා යනාදි වශයෙන් 2017 වර්ෂයේදී නිර්දේශ ලබාදී ඇත.

ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩල පනත නිරීක්ෂණය සඳහා නීතිපතිතුමාට යොමු කර ඇති අතර ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීමේ පනත සඳහා අදාල ආයතන වෙතින් නිරීක්ෂණ ඉල්ලා ඇත.
National Policy on High rise Buildings හා ඊට අදාල සම්බන්ධිකරණ කටයුතු සඳහා මුලික කෙටුම්පත අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ නීති හා රෙගුලාසි ප්‍රකාරව 2017 වර්ෂයේ ඉදිරිපත් කරන ලද තාක්ෂණ විගණන කාර්ය පටිපාටි හා සුදුසුකම්ලත් තැනැත්තන් ලියාපදිංචි කිරීම මෙන්ම කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වන පාර්ලිමේන්තු අනුමැතිය 2018/08/08 දින ලැබී ඇත.

තවද සුදුසුකම්ලත් පුද්ගලයන්ගේ විනය ක්‍රියාමාර්ග, කොන්ත්‍රාත්කරුවන්ගේ විනය ක්‍රියා පටිපාටිය, විදේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ තාවකාලික ලියාපදිංචිය යනාදී කරුණු සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත.

## 9.4.1. නාගරික ජනාවාස අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, ඉදිකිරීම් සංවර්ධන අධිකාරිය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව මගින් 2017 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 21 ක් මුලික විමර්ශණ සිදුකර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා සැලසුම් අංශය වෙත බාර දී ඇත.

## 9.5 ජාතික නිවාස කොමසාරිස් අංශය

1973 අංක 1 දරණ නිවාස දේපළ උපරිමය නීතිය යටතේ රජයට පවරාගත් නිවාස වල කුලී නිවැසියන්ට ඔප්පු ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ ඔප්පු 09 ක් ලබා දී ඇත. ඒ අනුව පරීක්ෂණ 19 ක් පවත්වා ඇති අතර ස්ථාන පරීක්ෂණ 18 ක් පවත්වා ඇත.

පැවරී ඇති නිවාස දේපල වලට අදාල ඔප්පු සැලකිය යුතු ප්‍රමාණයක් නිකුත් කර ඇති අතර පැවරුම්කර 17,842 ක් නිකුත් කොට ඇත.

රජයට පවරාගත් නිවාස වල අයිතිකරුවන්ට වන්දි ලබාදීම් විශාල ප්‍රමාණයක් අවසන් කර ඇත.

යම් යම් නිවාස දේපල සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු වලදී අදාල මුල් ගොනු, ලේඛන, ගැසට්පත්‍ර සහ පිඹුරු ආදිය නොමැති වීම හේතුවෙන් පරීක්ෂණ අවසන් කිරීමට නොහැකි වීම අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී අභියෝගයක් විය.

## 9.6 අභ්‍යන්තර විගණන අංශය

2017 වාර්ෂික විගණන වැඩසටහන අනුව වර්ෂය තුළ වැඩසටහන් 18 ක් අපේක්ෂා කලද ඉන් වැඩසටහන් 06 ක වැඩ අවසන් කිරීමට හැකි විය. තවද ඉලක්ක කල පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් හා මුලික විමර්ශන 05 ක් සිදු කිරීමට හැකියාව ලැබිණි.

විමර්ශන කටයුතු මෙහෙයවීමට හා විගණන කටයුතු සම්බන්ධයෙන් පළපුරුදු කාර්යය මණ්ඩලයක් නොමැති වීමෙන් අංශයෙහි රාජකාරි කටයුතු සිදු කිරීමේදී ගැටලු සහගත බවක් ඇති වේ.



පොලොන්නරුව දිඹුලාගල සඳරැස්ගම
සැමට සෙවණ ප්‍රතිලාභ ලබාදෙමින්



නිවාස අවශ්‍යතා පිළිබඳ දීපව්‍යාප්ත
දත්ත සමීක්ෂණය එළිදක්වමින්



පොල්පිතිගම, විජයබාගම ආදර්ශ
ගම්මානය ජනතා අයිතියට පත් කිරීම



ලුණුගම්වෙහෙර, සියතුරුගම ආදර්ශ
ගම්මානය ජනතා අයිතියට පත්කරමින්



නිවාස ව්‍යාපෘති සඳහා ඉන්දීය රජය හා
ශ්‍රී ලංකා රජය අතර අවබෝධතා ගිවිසුම්
අත්සන් කිරීම.



ආදර්ශ ගම්මාන වැඩසටහනෙහි ආහාර
නිෂ්පාදන ජාතික වැඩසටහනෙහි ප්‍රගතිය
නිරීක්ෂණය



විල්ගමුව, ජයවිජයගම ආදර්ශ
ගම්මානය ජනතා අයිතියට පත්කරමින්



විසිරි නිවාස වැඩසටහනෙහි කොළඹ
දිස්ත්‍රික්කයේ මූලාධාර චෙක්පත් ප්‍රදානය

## 10. 2017 වර්ෂයේදී අමාත්‍යාංශය මුහුණදුන් අභියෝග.

❖ **ස්ථිර තනතුරු වල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වීම.**

අමාත්‍යාංශය සඳහා අනුමත කරන ලද ස්ථිර තනතුරු වල පුරප්පාඩු නිසි පරිදි සම්පූර්ණ කරගැනීමට අමාත්‍යාංශයට 2017 වර්ෂයේදී හැකියාව නොලැබුණි. ප්‍රධාන වශයෙන් අමාත්‍යාංශය සඳහා අනුමත තනතුරු වන ප්‍රධාන මූල්‍ය නිලධාරි, අධ්‍යක්ෂ (ඉංජිනේරු තාක්ෂණ) හා අධ්‍යක්ෂ (නාගරික ජනාවාස), සහකාර අධ්‍යක්ෂ (නාගරික ජනාවාස), අධ්‍යක්ෂ (ඉදිකිරීම් තාක්ෂණ) යන තනතුරු වල පුරප්පාඩු එම දීප ව්‍යාප්ත සේවාවල සුදුසුකම් ලත් නිලධාරීන්ගේ පැවති හිඟකම් හේතුවෙන් සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය.

තවද විගණන හා විමර්ශන කටයුතු සඳහා පලපුරුදු කාර්යය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් විගණන කටයුතු වල පසුබෑමක් ද දක්නට ලැබුණි.

❖ **වත්කම් මිලදී ගැනීම් සඳහා ප්‍රමාණවත් මුල්‍ය ප්‍රතිපාදන නොලැබීම.**

අමාත්‍යාංශයට අවශ්‍ය වත්කම් මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් 2017 වර්ෂයේදී අමාත්‍යාංශයේ දෛනික කාර්යයන් සඳහා බාධා එල්ල විය. අමාත්‍යාංශයේ සේවයේ නියුතු නිලධාරීන්ගේ පරිහරණය සඳහා ප්‍රමාණවත් පරිදි පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර නොතිබුණු අතර ඒවා මිලදී ගැනීම සඳහාද ප්‍රමාණවත් ප්‍රතිපාදන අමාත්‍යාංශය වෙත වෙන් වී නොපැවතීම හේතුවෙන් දැනට භාවිතා කරන උපකරණ අකාර්යක්ෂම මට්ටමින් භාවිතා කිරීමට සිදුවිනි. එම නිසා එම උපකරණද නිරන්තර දෝෂ තත්ත්වයන්ට ලක්වීම හේතුවෙන් දෛනික කාර්යයන් නිසි පරිදි ඉටුකර ගැනීම දැඩි අභියෝගයට ලක්විය.

❖ **නිවාස වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පාන ලද අභියෝග**

මුදල් වර්ෂය තුළ නිවාස වැඩසටහන සඳහා වෙන් කරන ලද සමස්ථ ප්‍රතිපාදනය සඳහා 100% මුල්‍ය ප්‍රගතියක් වර්ෂය අවසාන වන විට උදාකර ගැනීමට සමත් වුවද ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය පසුබෑමකින් තොරව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පරිදි මුදල් කලට වේලාවට ලබාගැනීම දුෂ්කර විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය මැද දී සැලසුම් සංශෝධනය කිරීමට සිදු විය.

තවද ආදර්ශ ගම්මාන නිවාස වැඩසටහන සහ මධ්‍යම පාන්තික නිවාස වැඩසටහන සඳහා අවශ්‍ය කරන ඉඩම් ප්‍රමාණවත් පරිදි හඳුනාගැනීමට මෙන්ම, ඒ සඳහා වෙන්කර ගැනීමට නොහැකි විය. එසේ වෙන්කරන ලද ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා වෙන්කර දුන් ඉඩම් විශාල ප්‍රමාණයක් මූලික යටිතල පහසුකම් හිඟ ප්‍රදේශයන්හි ස්ථානගත වී තිබීම හේතුවෙන් විකල්ප ක්‍රියාමාර්ග ඔස්සේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙහෙසී කටයුතු කිරීමට ද සිදු විය.